www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | ඒකකය 19 - බළන්ගොඩින් ගැලූ පැණසර මෙත් ගඟුල

❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහත ප්‍රකාශන සනාථ කිරීම සඳහා ආනන්ද මෛත්‍රීය හිමිගේ චරිතයෙන් ගත හැකි නිදසුන් අවස්ථා පාඩම ඇසුරින් සොයා ලියන්න.

(1). තම ළමා කාලය ස්මරණය කරමින් ඒ හිමිපාණන් පවසන්නේ සෑම ජාතියක්ම එකට මිත්‍රව ජීවත් වීම නිසා කුල, පන්ති, ආගම් භේද දුරු වී යයි.

(2). බළන්ගොඩ නාහිමියෝ පැරැන්නෙකු වූවා මෙන් ම, වර්තමානිකයකු ලෙස ද කටයුතු කළ හැකි ජීව ගුණයකින් හා ශක්තියකින් යුක්ත වූහ.

(3). දැනුමෙන් සන්නද්ධ වූ උන්වහන්සේ බුදුන් වදාළ දහම් මග හෙළි පෙහෙළි කරන්නට පරමාදර්ශීව කටයුතු කළහ.

(4). උන්වහන්සේගේ ශාස්ත්‍රවන්තභාවය අන්තර්ජාතික සම්භාවනායට පාත්‍ර විය.

(5). අන්මත ගරු කිරීමේ උදාර ගුණයට උන්වහන්සේ හිස නැමූහ.

(6). තමන් වහන්සේ අත්පත්කරගත් දැනුම් සම්භාරය පිළිබඳව ප්‍රත්‍යක්ෂ විශ්වාසය උන් වහන්සේ තුළ විය.

02. පහත සඳහන් වචන යොදා එහි අරුත් පැහැදිලි වන සේ වාක්‍යය නිර්මාණය කරන්න.

| | | |
|---|---|---|
| (1). සම්භාව්‍ය | (6). ප්‍රතීචීන භාෂා | (11). සියත් බවින් |
| (2). නැණසර | (7). භාෂාන්තර ඥානය | (12). වියත් බවින් |
| (3). ස්වාධ්‍යයනයෙහි | (8). අතික්‍රමණය | (13). විස්මයාවහ |
| (4). නෛපුණ්‍යයක් | (9). ෂට්ඨ සංගායනාව | (14). කරුණා පරවශ |
| (5). අර්චනීය | (10). කිත් යසස් | (15). චිරස්ථිතියට |

03. පහත වාක්‍යයන්හි නිවැරදි වාක්‍යයක් තැනීමට සුදුසු ක්‍රියා පදය තෝරා එයට අදාළ ව්‍යාකරණ රීතිය කෙටියෙන් ලියන්න.

(1). සති දෙකක් පමණ රෝගාතුරව සිටි මහනායක හිමියෝ අපවත් (විය/වූහ)

(2). වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා රැස්ව සිටි ජනතාව (ඇමතුවේ ය/ඇමතූහ).

(3). සිත් තුළ දැහැමි සිතුවිලි පහළ (වේවා/වෙත්වා).

(4). ඇතැම්හු ප්‍රත්‍යය ලාභයෙන් කටයුතු (කරති/කරහු).

(5). දායක දායිකාවන් විසින් උන් වහන්සේ ගෞරවපූර්වකව පිළිගන්නා (ලදි/ලදහ).

*සැකසුම: ප්‍රියංගනී මිය*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk